# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1952/36 – 2016 පෙබරවාරි 03 වැනි බදාදා – 2016.02.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/C/2014/77.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එම්. ඒ. එස්. පී. සේනාරත්න මයා, පෙරකදෝරුවත්ත, බිංගිරිය.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

රාජ්‍ය දැව සංස්ථාව, අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය, වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් බත්තරමුල්ල, පන්නිපිටිය පාර, අංක 77, ටී. පියසෝම මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 ජනවාරි මස 28 වැනි දින,
කොළඹ දී ය.




*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/02/C/2014/77.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එම්. ඒ. එස්. පී. සේනාරත්න මයා, පෙරකදෝරුවත්ත, බිංගිරිය.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

රාජ්‍ය දැව සංස්ථාව, අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

රාජ්‍ය දැව සංස්ථාවේ රත්නපුර ප්‍රාදේශිකයේ වැඩබිම් නිලධාරී තනතුරෙහි සේවය කළ එම් .ඒ. එස්. පී. සේනාරත්න මහතා හට 2011.08.24 දිනැති චෝදනා පත්‍රය මත විනය පරීක්ෂණයක් පවත්වා ලබා දී ඇති දඬුවම් යුක්ති සහගත වන්නේ ද යන්නත්, එසේ යුක්ති සහගත නොවන්නේ නම් ඔහුට ලබාදිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2015 දෙසැම්බර් මස 12 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

02 - 550

---

මගේ අංකය: IR/COM/03/Q/2014/103.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එන්. ඩී. සී. ආරියවංශ මිය, අංක 345/6, දුටුගැමුණු මාවත, පට්ටිය හන්දිය, කැලණිය.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ආයතන අනධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය, වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් රත්මලාන, සිරිමල් උයන, අරලිය මාවත, අංක 03, ආර්. එස්. ආරියප්පෙරුම මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 ජනවාරි මස 28 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/Q/2014/103.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එන්. ඩී. සී. ආරියවංශ මිය, අංක 345/6, දුටුගැමුණු මාවත, පට්ටිය හන්දිය, කැලණිය.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ආයතන අනධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

"කැලණිය විශ්වවිද්‍යාලයේ සැපයුම් අංශයේ ලිපිකාරිනියක (1 ශ්‍රේණිය) ලෙස සේවය කරන එන්. ඩී. සී. ආරියවංශ මහත්මිය රාජකාරි වේලාව තුල පෞද්ගලික කටයුතු සඳහා ආයතනයෙන් බැහැර යාම පාදක කොට ගෙන මූලික විමර්ශනයක් පමණක් පවත්වා 2013.08.18 වැනි දිනට හිමි වැටුප් වර්ධකය විලම්භනය කිරීම යුක්තිසහගත ද යන්න හා එසේ යුක්ති සහගත නොවන්නේ නම් ඇයට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ."

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2015 දෙසැම්බර් මස 21 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

02 - 551

---

මගේ අංකය: IR/COM/03/Q/2014/73.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

පී. පී. සේනානායක මිය, අංක 48/3, කෝට්ටගෙවත්ත පාර, බත්තරමුල්ල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්, අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය, වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති

බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් බොරලැස්ගමුව, පිරිවෙන පාර, අංක 128 හි එස්. විරිතමුල්ල මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 ජනවාරි මස 28 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/Q/2014/73.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

පී. පී. සේනානායක මිය, අංක 48/3, කෝට්ටගෙවත්ත පාර, බත්තරමුල්ල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්, අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හි විධායක III ශ්‍රේණියේ නිලධාරිනියක ලෙස උසස්වීම් ලබා සිටින පී. පී. සේනානායක මහත්මිය එම ශ්‍රේණියට අදාළ තනතුරක් සහ ඊට අදාළ රාජකාරි ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම යුක්ති සහගත වන්නේ ද සහ එසේ යුක්ති සහගත වන්නේ නම් ඇයට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2015 දෙසැම්බර් මස 21 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

02 - 552

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.